**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම් රු.4,819,476 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,498,934 ක් ලෙස දක්වා තිබීම නිසා ආදායම රු.320,542 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වෙළඳ ස්ථාන 10 ක් බදුදීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,550,095 ක් වූ ආදායම්, ආදායම් වියදම් ගිණුමේ රු.1,430,095 ක් ලෙස දක්වා තිබීම නිසා ආදායම රු.120,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.883,550 ක ව්‍යාපාර බදු සහ වෙළඳ බලපත්‍ර ආදායම්, ආදායම් වියදම් ගිණුමේ රු.894,550 ක් ලෙස දක්වා තිබීම නිසා ආදායම් රු.11,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රු.1,372,750 ක්වූ කසල බදු ආදායම, මූල්‍ය ප්‍රකාශනවල රු.1,333,457 ක් ලෙස දක්වා තිබීම නිසා ආදායම රු.39,293 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම වැටුප් දායක වියදම් රු.255,736 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.234,779 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.20,957 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සභාවට භාර දී තිබුණු පිරිවැය රු.40,888,592 ක් වූ පුරනැගුම ගොඩනැගිල්ල රු. 34,755,303 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.6,133,289 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2017 සහ 2016 වර්ෂවලට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු 4,651,950.ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්**

**(අ) ලැබියයුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාස 06 සිට මාස 94 දක්වා කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ස්ථාන 147 කින් ලැබිය යුතු කසළ බදු ආදායම රු.374,362 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 30 කින් මාස 03 සිට මාස 78 දක්වා කාලපරාසයක් වෙනුවෙන් ලැබිය යුතු කඩ කාමර ආදායම් රු.79,430 ක් විය.

(iii) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 72 ක් වෙනුවෙන් ලැබිය යුතු ශේෂවල එකතුව රු.34,750,912 ක් විය.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල සභාව ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 92 ක් වෙනුවෙන් රු.37,014,374 ක් ගෙවිය යුතුව තිබුණි.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 269,369,103 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.4 අනුකූල නොවීම්**

**1.3.4.1නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 | සභා බලප්‍රදේශයේ පිහිටි කර්මාන්ත සහ වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණයක් සිදුකර ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාවක් කර නොතිබුණි. |

1.3.4.2 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම.

----------------------------------------

2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත අනුව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් නොවැම්බර් කාලපරිච්ඡේදයේ දුරකථන කුළුණු ආදායම් අය කිරීමේදී අයකර තිබුණු රු.18,300 ක මුද්දර බදු 2018 ජූලි 31 දින වන විට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,119,587 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,778,852 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017ජනවාරි 01දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017.01.01 හිඟයෙන් වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017බිල්කළ මුදලින් වටිනාකම | 2017දෙසැම්බර් 31දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| කඩ කුලී | 135,121 | 1,647,180 | 85,780 | 914,740 | 79,430 |
| කසල බදු | 339,500 | 1,333,457 | 107,450 | 1,137,300 | 428,207 |
| බදුදීම (ටෙන්ඩර්) | 297,900 | 1,430,095 | 174,033 | 1,315,464 | 69,202 |
| උසාවි දඩ | 3,720,731 | 4,498,934 | 3,042,572 | - | 5,386,180 |
| මුද්දර ගාස්තු | 1,867,211 | 1,150,000 | 1,867,211 | 779,499 | 370,501 |
| කර්මාන්ත බදු | - | 140,800 | - | 140,800 | - |
| ව්‍යාපාර බදු (සිල්ලර වෙළදාම) | - | 163,250 | - | 163,250 | - |
| ව්‍යාපාර බදු | - | 105,250 | - | 615,050 | - |
| බලපත්‍ර ගාස්තු | - | 105,250 | - | 105,250 | - |
| එකතුව | 6,360,463 | 10,574,216 | 5,277,046 | 5,171,353 | 6,333,520 |

2.2.2 වරිපනම් හා බදු

---------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව රණජයපුර ත්‍රිවිධ හමුදා නගර සංකීර්ණ බලප්‍රදේශය දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර තිබුණද, එම ප්‍රදේශය තුළ පිහිටි නිශ්චල දේපලක හෝ  නිශ්චල දේපල වර්ගයක වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අයකර නොතිබුණි.

2.2.3 බදුකුලී

-----------

2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල වෙළඳ ස්ථාන 03 කින් එකතුව රු. 93,177 ක් වූ වාර්ෂික බදු ආදායම් අයකර ගෙන නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

--------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර බදු ආදායම රු.370,501 ක් විය.

2.2.5 උසාවි දඩ ආදායම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ ආදායම රු.5,386,180 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා පොදු මංමාවත් පිළිබඳව පාලනය  විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

පිළිසරු ඒකකයක් ස්ථාපිත කර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ කසල එක්රැස් කර කොම්පොස්ට් පොහොර නිපදවීම සිදු කරන අතර, එම ඒකකයෙන් රු.158,500 ක ආදායමක් උපයා තිබුණි. විකිණීමට හෝ කොම්පොස්ට් නිපදවීමට යොදා නොගන්නා පොලිතීන් සහ ප්ලාස්ටික් වැනි ඝණ අපද්‍රව්‍ය ගිනිතැබීම සහ වැළලීම සිදු කරන බැවින් පරිසරයට සහ සෞඛ්‍යයට හිතකර ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ  2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් හිරිපිටියාගම, මහඉලුප්පල්ලම, රණජයපුර යන ස්ථානවල පිහිටි පොදු වැසිකිලි සහ රණජයපුර සතිපොල ගොඩනැගිල්ල මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් වශයෙන් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) පිරිවැය රු.687,000 ක් වූ ට්‍රැක්ටර් ටේලරයක් සහ ජලබවුසර් 02 ක් ලියාපදිංචි නොකර සන්තකයේ රඳවාගෙන ධාවනයේ යොදවමින් තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාල සභාවේ සේවයේ නියුතුව සිට සේවය හැර ගිය, ස්ථානමාරු වී ගිය සේවකයින් 03 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.8,500 ක සේවක ණය 2018 අගෝස්තු වන විටත් අයකර නොතිබුණි.

3.4 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් කඩකාමර 53 ක් බදුදීමට අදාල ගිවිසුම් 1992 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුලදී අත්සන් කර තිබුණු නමුත් ඒවා සංශෝධනය කර ගිවිසුම් යාවත්කාලීනව පවත්වාගෙන යාමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ මූල්‍ය ප්‍රකාශන සහ වත්කම් ලේඛන අනුව ස්ථාන 02 ක කඩ කාමර 46 ක් තිබෙන බව දක්වා තිබුණද කඩ කාමර කුලී ලේඛනය අනුව එම ස්ථාන 02 හි කඩ කාමර 32 කින් පමණක් කුලී අයකර තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

3.5.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,150,800 ක් වූ වාහන සහ යන්ත්‍ර උපකරණ යනාදිය වර්ෂ කිහිපයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

3.6 අවිධිමත් ගනුදෙනු

---------------------

සමාලෝචිත වර්ෂයේ බදුකරුවන් දෙදෙනෙකු විසින් ගිවිසුම්ගත බදු මුදලින් රු.120,000 ක් පූජනීය ස්ථානයක් වෙත සෘජුවම ගෙවා ඉතිරිය සභාවට ගෙවා තිබුණි.

3.7 හඳුනාගත් පාඩු

--------------------

සභා බලප්‍රදේශයේ ස්ථාන 02 ක පිහිටි කඩකාමර 19 කින් පූර්ව වර්ෂ 23 ක් ඉක්මවූ කාලපරිච්ඡේදයක සිට කඩකුලී අයකර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,457,600 ක මූල්‍යමය පාඩුවක් සභා අරමුදලට සිදුව තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
--------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෑජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු සභාවට පත්කර තිබුණද අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය තවදුරටත් යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | i. සියළුම වත්කම් ලේඛනගත නොකිරීම.<br>ii දේපලවල අයිතිය පවරාගෙන නොතිබීම.<br>iii. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ යෝජනා ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ). | ආදායම් රැස් කිරීම. | i. දේපළ තක්සේරු නොකිරීම.<br>ii. හිඟ ආදායම් රැස් කිරීම කාර්යක්ෂම නොවීම.<br>iii. ආදායම් නිලධාරීගේ වැඩ සුපරික්ෂණය නොකිරීම. |
| (ඈ) | අභ්යන්තර පාලනය | අභ්‍යන්තර විගණනය සිදුකර වාර්තා ඉදිරිපත් නොකිරීම. |